# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973 (HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 587/ 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 05/04/2024<br>පැය 1205 |

# මාධ්‍ය නිවේදනය

## 01. මනුෂ්‍ය ඝාතනයක් - ධර්මපුරම් පොලිස් වසම.

2024.04.04 වන දින සවස් කාලයේ ධර්මපුරම් පොලිස් වසමේ මයිල්වානපුරම් ප්‍රදේශයේදී පහරදීමෙන් බරපතල තුවාල ලැබූ පුද්ගලයෙකු ධර්මපුරම් රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇති බවට ධර්මපුරම් පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් අනුව විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 31 ක් වූ මයිල්වානපුරම් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු හා පිරිසක් අතර ඇතිවූ ආරවුලක් දුරදිග යාම හේතුවෙන් තියුණු ආයුධවලින් පහරදී මෙම ඝාතනය සිදුකර ඇති බවට අනාවරණය වී ඇති අතර මෘත ශරීරය කිලිනොච්චිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත.

ඝාතනයට සම්බන්ධ වයස අවුරුදු 34ක්වූ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත. අපරාධයට සම්බන්ධ සෙසු සැකකරුවන් හඳුනාගෙන ඇති අතර ඔවුන් අත්අඩංගුවට ගැනීම සඳහා ධර්මපුරම් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 02. මාරක රිය අනතුරක් -ත්‍රිකුණාමලය පොලිස් වසම.

2024.04.05 වන අද දින අළුයම් කාලයේ ත්‍රිකුණාමලය පොලිස් වසමේ ත්‍රිකුණාමලය ප්‍රධාන බස් නැවතුම්පල ආසන්නයේදී බස් නැවතුම්පලට ඇතුළු කිරීම සඳහා ධාවනය වෙමින් තිබූ බස් රථයක මාර්ගයේ ගමන් කළ පදිකයෙකු ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ පදිකයා ත්‍රිකුණාමලය රෝහලට ඇතුලත් කිරීමේදි මියගොස් ඇත.

**මරණකරු යාචකයෙකු බවට අනාවරණය වී ඇති අතර අනන්‍යතාවය මෙතෙක් තහවුරු වී නොමැත.**

මෘත ශරීරය ත්‍රිකුණාමලය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර ත්‍රිකුණාමලය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. මාරක රිය අනතුරක් -නාඋල පොලිස් වසම.**

2024.04.05 වන අද දින අළුයම් කාලයේ නාඋල පොලිස් වසමේ නාඋල ඇලහැර නව මොරගහකන්ද මාර්ගයේ වදුරමුල්ල ප්‍රදේශයේදී මොරගහකන්ද දෙස සිට කෝන්ගහවෙල දෙසට ධාවනය වූ ලොරි රථයක් මාර්ගය හරහා ගමන් ගත් වන අලියෙකුගේ ගැටී ලොරි රථය පෙරලී ගොස් අනතුරක් සිදුවී ඇත.

අනතුර සිදුවන අවස්ථාවේ ලොරි රථයේ රියදුරු ඇතුළු පුද්ගලයින් 07 දෙනෙකු ගමන් ගත් අතර අනතුරින් බරපතල තුවාල ලැබූ ලොරි රථයේ පිටුපස ගමන් කළ පුද්ගලයින් දෙදෙනෙකු කෝන්ගහවෙල රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇති අතර බරපතල තුවාල ලැබූ තවත් පුද්ගලයින් දෙදෙනෙකු ප්‍රතිකාර සඳහා මාතලේ රෝහලට ඇතුලත් කර ඇත .

**මරණකරුවන් අවුරුදු 25 ක් වන වැලිකන්ද හා නිකදළුපත ප්‍රදේශ වල පදිංචිකරුවන් වේ.**

මෘත ශරීර කෝන්ගහවෙල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. බ ඉලොරි රථයේ රියදුරු අනතුරින් පසු පලාගොස් ඇත. රියදුරු අත්අඩංගුවට ගැනීම සඳහා නාඋල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**